DOI: 10.31357/fhssmst.1998.00024

# නිදහසෙන් පසු ශ්‍රී ලංකාවේ බුදුසමය හා දේශපාලනය

ඒ. ආර්. කරුණානායක
ලේඛනාරූඪ අංකය: ඒ 12873

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ
ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය සඳහා
ඉදිරිපත් කෙරෙන ශාස්ත්‍රීය නිබන්ධය
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
ශ්‍රී ලංකාව.
1998

# සහතික කිරීම.

උපදේශක මහාචාර්යතුමා,
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය.

"නිදහසින් පසු ශ්‍රී ලංකාවේ බුදුදහම හා දේශපාලනය" නම් වූ මෙම නිබන්ධය උපදේශකවරුන්ගේ උපදෙස් පරිදි මා විසින් ස්වෝත්සාහයෙන් නිර්මාණය කළ බවත් වෙනත් ග්‍රන්ථයකින් පිටපත් කර නොගත් බවත් මෙයින් සහතික කරමි.

අනෝමා රංජනී කරුණානායක
ශාස්ත්‍රපති උපාධි අපේක්ෂිකා.
(ඒ 12873)

අධ්‍යයනාංශ ප්‍රධානතුමා,
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය.

දෙන ලද උපදෙස් පරිදි ශාස්ත්‍රපති උපාධි අපේක්ෂිකා ඒ.ආර්. කරුණානායක මහත්මිය විසින් රචනා කරන ලද මෙම නිබන්ධය ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය සඳහා ඉදිරිපත් කිරීමට යෝග්‍ය තත්වයක පවතින බව සහතික කරමි.

මහාචාර්ය චන්ද්‍රිම විජේබණ්ඩාර
උපදේශක. 27-2-98

පීඨාධිපතිතුමා,
පශ්චාත් උපාධි පීඨය.

ඒ.ආර්. කරුණානායක මහත්මිය විසින් ශාස්ත්‍රපති පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන ලද මෙම නිබන්ධය අවශ්‍ය කටයුතු සඳහා නිර්දේශ කොට ඉදිරිපත් කරමි.

27.2.98
ආචාර්ය ආරියපාල පෙරේරා
අධ්‍යයනාංශ ප්‍රධාන පාලි හා බෞද්ධ
අධ්‍යයනාංශය.

ශ්‍රී ජයවර්ධනපුර
විශ්වවිද්‍යාලය
27 FEB 1998
පාලි හා බෞද්ධ
අධ්‍යයනාංශය.

## පි දු ම.

" බ්‍රහ්මාති මාතා පිතරෝ - පුබ්බාචරියාති වුච්චරෙ "'

මවුපියෝ " බ්‍රහ්ම " නම් වෙති - පූර්වාචාර්යයෝ ඔව්හුමය.

දරු සෙනෙහසින් ඇති දැඩි කොට ලෝකය හඳුන්වා දි දෙනෙත් පෑදූ සදාදර මෑණියන්ට හා පියාණන්ට මාගේ මේ ශාස්ත්‍රීය නිබන්ධ පුෂ්පය උපහාර පූජාවක් වේවා!

- අනෝමා රංජනී කරුණානායක. -

## ස්තුතිය

සරසවි වරම් ලැබ මීට අටළොස් වසරකට පෙර දී පා නැගූ විද්‍යෝදය ගුරුගෘමියේදී ම ශාස්ත්‍රපති උපාධිය සඳහා මෙබඳු පර්යේෂණයක් කිරීමට මා මෙහෙයවා, උදව් කොට මග පෙන්වූ මහාචාර්ය චන්දිම විජේබණ්ඩාර මහතාට, ආචාර්ය මීගොඩ පඤ්ඤාලෝක හිමියන්ට හා මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ මහත්මාට ද, අධ්‍යයන අංශ ප්‍රධාන ආචාර්ය ආරියපාල පෙරේරා මහත්මයාණන්ට ද ප්‍රථමයෙන්ම කෘතඥතා පෙරටුව ස්තුතිය පුද කරමි.

විවිධ ඉංග්‍රීසි පොතපත ඇසුරු කිරීමට උදව් කළ ආදරණීය පියාණන් වූ කේ. පී. පී. කරුණානායක මහත්මානන්ට ද, නාමාවලිය සකසා දුන් රෝහිණී කරුණානායක සොයුරියට ද, පිටපත් කිරීමෙන් සහාය දුන් නිශාන්ති ප්‍රියදර්ශනී මෙනෙවියට ද, පොතපත සපයා දීමෙන් උදව් කල ජිනදාස සිටුගේ මහතාට ද, පුස්තකාලයේ හිතවතුන්ට ද, යතුරුලියනය කළ ගුණවර්ධන මහතාට හා සංඛ ආයතනයට ද ස්තුති කරන්නේ කෘතඥතා ගුණය සිහි කරමිනි.

අන්තිමට වුවත්, හැමදා මුලින් ම සිට මා දිරිමත් කළ අමිතට හදපිරි අදරින් ස්තුතිය පිළිගන්වමි.

## හැඳින්වීම

නිදහසින් පසු ශ්‍රී ලංකාවේ බුදු සමය හා දේශපාලනය එකට බැඳී ක්‍රියාත්මක වන විෂය දෙකක් සේ සැලකෙන තරමට සම්බන්ධතාවක් විද්‍යමාන කර ඇති බව නොරහසකි. අළුත නිදහස ලබන රාජ්‍යයක දේශපාලන විෂයෙහි බලපාන ප්‍රමුඛ සාධක තේරුම් ගැනීම එම රාජ්‍යයෙහි ප්‍රගතිය සැලසුම් කිරීම විෂයෙහි මෙන්ම ගැටළු අවබෝධ කර ගැනීම / විෂයෙහිද අර්ථවත් වන හෙයින් ශ්‍රී ලංකා දේශපාලනය බුදු සමය නම් සාධකය සමඟ ක්‍රියාත්මක වන ආකාරය ශාස්ත්‍රීය ලෙස විමසීම අර්ථවත් වෙතැයි යන ප්‍රතිග්‍රාහිතය මත මෙම විමර්ශනය සැලසුම් කරමු. නිදහසින් පසු මෙරට සෑම මැතිවරණයකදීම පාහේ ආගම පිළිබඳව ප්‍රධාන පක්ෂ ප්‍රතිපත්ති ප්‍රකාශයන්හි සඳහන් වීම, දේශපාලන වේදිකාවන්හි බෞද්ධ භික්ෂූන්ගේ සහභාගීත්වය විද්‍යමාන වීම යන රාජ්‍ය ප්‍රතිපත්ති, ඒවා බුදුසමය කෙරේ බලපාන ආකාරය පිළිබඳ විශේෂ සැලකිල්ලක් ඇතිව විවේචනය කිරීම වැනි කරුණු නිරීක්ෂණය කරන විට මෙය සනාථ වනු ඇත.

විදේශාධිපත්‍යයට පෙරාතුව ශ්‍රී ලංකාවේ පැවති දේශීය රාජ්‍ය ව්‍යුහය තුළ බුදු සමය දේශපාලනය සමඟ ඉතා කිට්ටුවෙන් බැඳී තිබුනු ආකාරයත් එම සබඳතාව ගිලිහී යාමත් සමඟ ශ්‍රී ලංකා සංස්කෘතිය තුළ අර්බුද තත්ත්වයක් වර්ධනය වූ බවත් අපි ප්‍රථම පරිච්ඡේදයේ දී පැහැදිලි කරමු. මෙම අර්බුද තත්ත්වය තුළ වඩාත් ප්‍රකටව පෙනී ගියේ බෞද්ධ භික්ෂුව ප්‍රභූත්වයෙන් විසිවී යාම, විහාරස්ථාන අධ්‍යාපනික මෙන්ම ප්‍රජා ~~ක්ෂේත්‍රයක්~~ කේන්ද්‍රයක් වශයෙන් විද්‍යමාන කළ වැදගත්කම පිරිහී යාම සහ සම්ප්‍රදායික බෞද්ධ පවුල් වෙනත් ආගම් අදහන්නට පටන් ගැනීමය.

මේ නිසා මෙරට ඇතිවූ නිදහස් ව්‍යාපාරයක් තුළ බුදුසමය ද වැදගත් සාධකයක් වූ අයුරුත් බෞද්ධ භික්ෂූන් වහන්සේ හා සිංහල බෞද්ධ ප්‍රභූන් නිදහස් අරගලයට විවිධ අයුරින් දායක වූ අයුරුත් දෙවන පරිච්ඡේදයෙන් පැහැදිලි කිරීමට වෑයම් කර ඇත. මෙහිදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වර්ධනය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කිරීම පැදගත් වූ හෙයින් ඒ වෙනුවෙන් ප්‍රමාණවත් ලෙස කරුණු දැක්වීමු.

තුන්වන හා හතරවන පරිච්ඡේද නිදහසින් පසු ඇතිවූ බෞද්ධ පුනරුදය දේශපාලනය සමඟ බැඳී ඇති ආකාරය පරීක්ෂා කිරීමට කැප කර ඇත. ඇතැම්

දේශපාලන පක්ෂ මෙම සාධකය සාධනීය ලෙස උපයෝගී කර ගන්නා අතර තවත් පක්ෂ තම දර්ශන හේතුවෙන් ඒ විෂයෙහි උදාසීන ආකල්පයක් දැක්වූ ආකාරය මෙහි දී සාකච්ඡා වෙයි. මෙහි දී බෞද්ධ සංස්කෘතියෙහි විශේෂයෙන්, අධ්‍යාපනය භික්ෂූන් වහන්සේගේ සමාජ කාර්ය්‍යය යන කරුණු වල ඇතිවූ වෙනස්කම් සවිස්තරව දක්වමින් දේශපාලන ක්‍රියා මාර්ග සමඟ බුදු සමය සංකලනය වී ඇති ආකාරය කෙරේ විශේෂ අවධානය යොමුකර ඇත.

ඇතැම් අවස්ථා වලදී අප කරුණු දක්වන ආකාරය අනවශ්‍ය තරම් දීර්ඝ යැයි හැඟී යා හැකි වුවද, එසේ කරන ලද්දේ බුදුසමය දේශපාලනය හා සම්බන්ධ වූ ආකාරය පූර්ණ වශයෙන් අවබෝධ කර ගැනීමට එය අවශ්‍ය යැයි හැඟී ගිය හෙයිනි.

පටුන

I. පිළිගැන්වීම ii

II. උපකාරානුස්මෘති ii

III. හැඳින්වීම iii, iv

පළමුවන පරිච්ඡේදය 1-53

1.1 බටහිර ජාතීන් පැමිණීමට පෙර ශ්‍රී ලංකාවේ ආගමික, දේශපාලනික, ඓතිහාසික පසුබිම

1.2 බටහිර ජාතීන්ගේ සංක්‍රමණ හා ශ්‍රී ලංකාවේ ආගමික, සංස්කෘතික රටාවෙහි ඇතිවූ වෙනස්කම්

1.3 භික්ෂූන් වහන්සේගේ සේවාවන්ට හා නායකත්වයට සීමා පැනවීම

1.4 බෞද්ධාගමික පූජ්‍යස්ථාන කෙරෙහි ඇති වූ විදේශීය බලපෑම් හා විහාර, දේවාලගම් පනත

දෙවන පරිච්ඡේදය 54-114

2.1 බෞද්ධ ජාතික ව්‍යාපාරයේ වර්ධනය (ආගමික වාද, විවාද හා අධ්‍යාපන පුනරුදය ඇතුලත්ව)

2.2 රාජ්‍ය මන්ත්‍රණ සභා යුගය

2.3 සෝල්බරි ආණ්ඩු ක්‍රමය

2.4 උභය මන්ත්‍රී මණ්ඩලය

2.5 දේශපාලන පක්ෂ බුදු සමය හා භික්ෂූන් වහන්සේ

2.6 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව හා බුදු සමය

තුන්වන පරිච්ඡේදය 115-216

3.1 බෞද්ධ තොරතුරු පරීක්ෂක කොමිෂන් සභාව හා ප්‍රතිසංස්කරණ වාද

3.2 බුද්ධ ජයන්ති සංකල්පය හා බෞද්ධ ප්‍රබෝධය

3.3 1956 ආණ්ඩු පෙරළිය හා ප්‍රගතිශීලි භික්ෂු කොටස්වල නැගී සිටීම

3.4. I. පිරිවෙන් විශ්වවිද්‍යාල හා භික්ෂු අධ්‍යාපනයේ ඇතිවූ වෙනස්කම්

II. ජාතික අධ්‍යාපනය හා බුදු සමය (පාසල්වල ආගමික අධ්‍යාපනය, පාසැල් රජයට ගැනීමේ ව්‍යාපාරය)

III. පිරිවෙන් ව්‍යුහයේ ඇති වූ වෙනස්කම්

IV. බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය

V. බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ආරම්භය

හතරවන පරිච්ඡේදය 217-243

4.1 වාමාංශික දේශපාලනයෙන් ආගම් ප්‍රතික්ෂේප වූ ආකාරය

4.2 මාක්ස්වාදී දේශපාලන පක්ෂ වලට භික්ෂූන් වහන්සේගෙන් ලැබුණු සහාය

4.3 දේශපාලන පක්ෂ ප්‍රතිපත්ති හා ඒවායේ ආගමට හිමි වූ තැන

4.4 1971 සහ 1989 තරුණ විප්ලවීය නැඟී සිටීම සහ ඊට

බලපෑ ආගමික පසුබිම

නිගමනය 244-247

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 248-259

සූචිය . 260-265

# 1 පරිච්ඡේදය.

## බටහිර ජාතීන්ගේ පාලන සමය තුළ බුදුදහම හා දේශපාලනය.

1.1 බටහිර ජාතීන් පැමිණීමට පෙර ශ්‍රී ලංකාවේ පැවති ආගමික දේශපාලනික ඓතිහාසික පසුබිම:-

විජයාවතරණයෙන් ආරම්භ වූයේ යැයි කියැවෙන සිංහල ජනතාවගේ ශිෂ්ටාචාරය දේවානම් පියතිස්ස සමයේ සිදුවුණ මහින්දා ගමනයෙන් බෞද්ධ ශිෂ්ටාචාරය බවට පත් විය. මහාවංශයට අනුව "ලංකාවට බුදුදහම ගෙන එන ලද්දේ දෙවනපෑතිස් අවදියේදීය."[1] එතුමා රජ බවට පත් වූ පසු තුටු පඬුරු සහිත දූත පිරිසක් දඹදිව අශෝක රජු වෙත යැවීමේ ප්‍රතිඵලයක් වශයෙන් මිහිදු හිමි ප්‍රධාන ධර්මදූතයන් වහන්සේලා විසින් ලංකාවට බුදුදහම ගෙන එන ලදී. ලංකාවේ තථ්‍ය ඉතිහාසය ආරම්භ වන්නේ මෙලෙස ලක් වැසියන් බුද්ධාගම වැළඳගත් තැන සිටය. සිංහල සංස්කෘතියේ ආරම්භය මහින්දා ගමනය බව වල්පොළ රාහුල හිමියන්ද සඳහන් කර ඇත්තේ මිහිදු හිමියන් මෙහි ගෙන ආවේ හුදු ආගමක් පමණක් නොව අඟ සම්පූර්ණ ශිෂ්ටාචාරයක්[2] බව පෙන්වා දෙමිනි. මහින්දා ගමනයෙන් අප ලත් බුදුසමය මෙරට සමාජ, ආගමික, ආර්ථික, දේශපාලන ව්‍යූහය ශීඝ්‍ර පරිවර්තනයට ලක් කොට අදීන අභීත ශක්තිමත් සංස්කෘතියකට පදනම ලීය.[3] ක්‍රි.පූ.3 වන ශත වර්ෂයේදී බුද්ධාගම ලංකාවට පැමිණීමට පෙර ක්‍රමවත් ලෙස සංවිධානය වුණු ජාතිකාගමක් හෝ රාජ්‍යාගමක් හෝ මෙරට නොතිබුණු බව පෙනේ.[4]

මිහිදු මාහිමියන් මෙහි පැමිණෙන කාලයේ ලංකාව එතරම් දියුණු තත්වයක නොපැවැත්තේය. සිංහලයා ජාතියක් හැටියට දියුණු වන්නටත් ජාත්‍යන්තර කීර්තියට පත් වන්නටත් පටන් ගත්තේ බුද්ධාගම වැළඳ ගැනීමෙන් පසුවය. සිංහල සාහිත්‍ය, කලා ශිල්ප, ගෘහ - නිර්මාණය සහ නගර නිර්මාණය, රටවැසියාගේ අධ්‍යාපනය, සදාචාරය හා සෞඛ්‍ය රටේ ආර්ථික හා දේශපාලන තත්වය මිහිදු මාහිමියන් ඇතුළු භික්ෂූන්ගේ මාර්ග දේශකත්වයෙන් ක්‍රමයෙන් දියුණු වන්නට පටන් ගත්තේය.[5] බුද්ධාගම සිංහල දේශයේත් සිංහල ජාතියේත් උරුමය හා ජාතික ආගම හැටියට මේ දිවයිනෙහි ස්ථිරවම සදහටම පිහිටුවීම මිහිදු මාහිමියන්ගේ අදහස විය.

ලක්දිව දෙමවුපියන්ටදාව, ලක්දිවට උපන් කෙනෙකු ලක්දිවම මහණ වී, ලක්දිවදීම විනය ඉගෙන, ලක්දිවදීම විනය දේශනා කරන තුරු ලක්බිමෙහි බුද්ධ ශාසනය මුල් නොඇදෙන බැව් මිහිදු මාහිමියන් දේවානම් පියතිස්ස රජුගේ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් ප්‍රකාශ කළ බව[6] සමන්තපාසාදිකාවෙහි සඳහන් වේ. දෙවන පැතිස් රජු බෞද්ධයකු වීමෙන් ලද රාජ්‍යානුග්‍රහය, බුදුසමයේ ශීඝ්‍ර ව්‍යාප්තියට මුල්විය. අනුරාධපුරයේ 'මහ මෙවුනාව' කේන්ද්‍ර කොට ගෙන, ඈත එපිට ගම්දනව් කරා බුදුසමයේ දහම් පණිවුඩය පැතිර යන්නට විය. ලාංකික ජනී ජනයා එලෙසින් සවන් වත් සදහම් හඬින් අවදිව ඉමහත් ශ්‍රද්ධා භක්තියෙන් යුතුව බුදුදහම වැළඳ ගතිහ.[7]

අලුත් ධර්මයෙන් ඉගැන්වුණු සදාචාර ශික්ෂා සමුච්චයෙන් ශාන්ත සුඛිත ජීවිතයකට මග පෑදුනේය. ලක්දිව තුළ බුදුසමය ව්‍යාප්ත වීමේ ප්‍රතිඵලයක් වශයෙන් එතෙක් පැවති මිථ්‍යා ඇදහිලි ක්‍රම ක්‍රමයෙන් වෙනස් වන්නට විය. රට තුළ සෞභාග්‍යමත් දියුණු වක්ද ඇති විය. රජුවරු සිටුවරු ආදී ප්‍රභූ පිරිස් බුදුදහම වැළඳ ගැන්ම නිසා එහි අගය වටහා ගත් සාමාන්‍ය මහජනතාව ඉතා ශ්‍රද්ධායෙන් බුද්ධ ශාසනය කෙරෙහි ඇදෙන්නට විය. එවකට සිදු වූ ශීඝ්‍ර වෙනස් වීම් නිසා විවිධ ඇදහිලි වලින් වෙන්ව ගිය ජන සමාජයක්ව පැවති ශ්‍රී ලංකාව බුදුසමය නිසා එක් ජාතියක් වශයෙන් එක්සත් වූහ. අධ්‍යාපන, කලාශිල්ප, වාරිකර්මාන්ත, කෘෂි කර්මාන්තය, වෙළඳාම ආදී සියළුම සංස්කෘතික අංශයන් බුදුදහම පැතිරීමත් සමගම ආගමික මුහුණුවරකින් ස්ථිර විය.[8]

ලාංකිකයන්ගේ පාලන තන්ත්‍රය කෙරේ විශාල බලපෑමක් කිරීමටද මහින්දාගමනයට හැකි විය. රාෂ්ට්‍ර පාලනය බෞද්ධ මුහුණු වරක් ගත් අතර පෙරදී පුරෝහිත බමුණන්ගේ අනුශාසකය යටතේ වූ රාජ්‍ය පාලනය භික්ෂූන් වහන්සේගේ අනුශාසකත්වයට යටතට පැමිණියේය. රජු හා සංඝ සමාජය අතර මනා සබඳියාවක් ගොඩනැගුණු අතර අනුශාසකත්වය සංඝ සමාජය සතුවිය.[9]

බෞද්ධ සංස්කෘතික ප්‍රබෝධය සහ රජදරුවන් දුන් අනුග්‍රහය.

මිහිදු හිමියන් විසින් ධර්මයෙහි පිහිටවනු ලැබූ ලංකාවේ ප්‍රථම උවසුවා දේවානම් පියතිස්ස රජුය. දේවානම් පියතිස්ස රජතුමා බුදුදහම වැළඳගත් පසු රජ පවුලේ මෙන්ම ප්‍රභූපක්ෂයේ බොහෝ දෙනෙක් රජු අනුගමනය කරමින් නව ආගමට පිවිසියහ. රජුගේ සොහොයුරෙක් වූ මත්තාභය[10] බෑණා වූ අරිට්ඨ සහ සොහොයුරන් පනස් දෙනෙක්ද[11]

රජුගේ බිසවක වූ අනුලාද[12] එසේ ශාසනයට ඇතුළු වූ අය වූහ. මිහිඳු හිමියන් සහ පිරිසට අවශ්‍ය වූ සිව්පසය සැපයුයේ රජය මගිනි.

ලංකාව තුළ බුදුසමය ස්ථාවර වීමත් ලංකාවේ රාජ්‍යාගම බවට බුදුදහම පත් වීමත් දේවානම් පියතිස්ස රජු කාලයේදීම සිදු විය. රජකු හැටියට තමාට නිදහස් ලෙස පාලන කටයුතු කිරීම සඳහා හැකියාවක්, බලයත් දෙකම තිබියදී ධර්මාශෝක රජුගේ ඔවදනට අවනත වෙමින් දෙවනපෑතිස් රජු මිහිඳු හිමියන් ලවා මහා විහාරය සඳහා සීමා ප්‍රතිෂ්ඨාපනය කරන අවස්ථාවේ තමන්ටත් එම සීමාව ඇතුළත බුදුන්ගේ අණසක යටතේ වසන්නට ඉඩ සලසා දෙන ලෙස අයැදීය.[13] තම අණසකද අභිබවා යන උත්තරීතර බවක් රජු විසින්ම බුදුසසුන කෙරෙහි ආරෝපණය කිරීම මෙයින් ඇරඹිණැයි සිතිය හැකි අතර ලක්දිව රජකළ සියළුම රජුන්ට එය බලපෑවේ යයිද අනුමාන කළ හැකිය.

බුදුසසුන රාජ්‍යාගම වූවා මෙන්ම ධර්මය කෙරෙහි තිබූ අසීමිත භක්තිය හා විශ්වාසය හේතු කොට ගෙන දෙවන පෑතිස් රජු තම රාජ්‍යය සසුනට පූජා කළ බව මහාවංශයෙහි සඳහන් වේ.[14] දුටුගැමුණු රජතුමාද පස්වසරක්ම රාජ්‍ය ශාසනයට පූජා කල බව[15] එහි තව දුරටත් සඳහන් වේ. ලාංකික රජුන් බුදුදහම කෙරේ දැක්වූ මෙම අසීමිත ලැදියාව අධ්‍යාත්මික හැඩ ගැස්ම කෙරේද බලපෑවේය. අධ්‍යාත්මික හැඩගැස්ම පාලන ප්‍රතිපත්ති දැහැමි වීමටත් දැහැමි සමාජයක් ගොඩ නැගීමටත් බලපෑවේය.

මෙරට බුදුසමය තහවුරුවීමෙන් පසුව රජුගේ එකම පරමාර්ථය වූයේ බුදුසමය නගා සිටුවීමයි. ඒ සඳහා මුළු කාලයම කැප කළ රජුන්ද මෙරට වාසය කළ බව පෙනීයයි. බුදුදහම රාජ්‍යාගම වීම නිරායාසයෙන්ම සිදු විය. මේ නිසා බුදුදහමේ ආරක්ෂකයන් බවට රජුන් පත්වීම වැදගත් කරුණකි.

දෙවන පිය රජු සමය බුදුසමය පිළිබඳ මෙරට ඉතිහාසයෙහි ස්වර්ණමය යුගයයි. දේවානම් පියතිස්ස රජතුමා සංඝයාගේ පරිහරණය සඳහා අනුරාධපුරයෙහි මහාපාලි නම් පොදු දන්හලක් කර විය.[16] භික්ෂූන් උදෙසා කළද එය මුළු අනුරපුර අවධිය තුළම විවිධ පිරිස් වලට විශාල සේවයක් කළ බවට සාධක ඇත. නිකායන් මෙන් වෙන්වීමෙන් පසුව පවා භේදයක් නොතකා අනුරපුර ප්‍රධාන ආරාමවල සියළුම භික්ෂූන්ට මහාපාලිය පොදු බත්හලක් වූ බව[17] රසවාහිනියේ සඳහන් වේ.

දෙවනපෑතිස් රාජ්‍ය කාලය අවුරුදු හතලිහකි. ඒ වූ කලී නොකඩවාම සාමය පැවති කාලයකි. ඒ කාලය සම්පූර්ණයෙන්ම රටේ සාමාජික හා අධ්‍යාත්මික දියුණුව සඳහා යොදන ලදී. ඒ රජු තමන් විසින් ආරම්භ කරන ලද බුද්ධ ශාසනය රටේ ජාතික ආගම බවට පත් කිරීමේ කාර්යය සම්පූර්ණ වී එය ස්ථිර තත්වයකට පත් වූ බවද දුටුවේය. අශෝක රජු අනුව යමින් බෞද්ධ දර්ශණය පදනම් කරගෙන බෞද්ධ ජීවන මාර්ගයක් පිළිබඳ ශක්තිමත් පදනමක් හෙලිය. මේ අධ්‍යාත්මික පදනම මත අපේ කලාව, වාස්තු විද්‍යාව, සාහිත්‍ය හා ලේඛනයද සමෘද්ධියමත් සංවර්ධනයටත් පත් විය. එහි ස්වභාවය සම්පූර්ණයෙන්ම ආගමික විය.[18]

බුදුදහම ශ්‍රී ලංකාවේ පැතිර යාමට දේවානම් පියතිස්ස රජුගෙන් මෙන්ම ඔහුගේ අනුප්‍රාප්තික සිංහල රජදරුවන්ගේන් ලැබුණු අනුග්‍රහය එහිලා අතිශයින් වැදගත් වේ. රජ දරුවන්ගෙන් පමණක් නොව මැති ඇමති ආදී වූ ප්‍රභූවරුන්ගෙන් ලැබුණු අනුග්‍රහයද සැළකිය යුතු බව මහාවංශයේ මෙන්ම තත්කාලීන සෙල්ලිපි වලින්ද අනාවරණය වෙයි. එසේම බුදු දහම වැළඳ සාමාන්‍ය ජනයා තම ආගමේ පැවැත්මට අවශ්‍ය සෑම උපකරණයක්ම කිරීමට සැදි පැහැදී සිටි අයුරු භික්ෂූන්ගේ වාසය පිණිස ලෙන් පූජා කිරීමට හා වෙනත් අවශ්‍යතා සපුරා ලීමට ඉදිරිපත් වීමෙන් සනාථ වෙයි.

දේවානම් පියතිස්ස රජුගේ සොයුරු සූරතිස්ස රජුගේ දැහැමි පාලන කාලය අවසන් වූයේ ඉන්දියාවේ සිටි පැමිණි ද්‍රවිඩයන් දෙදෙනෙකු වන සේන හා ගුත්තික විසින් රාජ්‍ය පැහැර ගැනීමෙනි. ඔවුන්ගේ රාජ්‍යානුශාසනය පිළිබඳව මහාවංශයෙහි "ධම්මෙන" යන පදයෙන් ඇඟවෙන්නේ ඔවුන් යටත් පිරිසෙයින් බෞද්ධ සිරිත් අනුව රට පාලනය කරන්නට ඇති බවයයි රාහුල හිමියෝ පවසති.[19]

එළාර රජු බෞද්ධයකු නොවූ[20] නමුත් පාලනය ගෙන යාම පහසු කර ගැනීමේ උපායක් වශයෙන් බුද්ධාගමට අනුකූලතාවයක් දැක්වූවෙකි. එළාර බුදුදහම පිළිබඳ අවංකව උනන්දු නොවූවද ඔහුට රටේ සම්මත සිරිත් විරිත් පිළිපදින්නට සිදු වී යයි මහාවංශකරු සැලකූ බව[21] පෙනේ. සෑගිරියට ශගාස් භික්ෂූන්ට දානයට ආරාධනා කර එද්දී ඔහුගේ රථයේ වියගස වැදී ඔහු නොදැනුවත්වම චෛත්‍යයේ කොටසක් කැඩී ගියේය. නීතිය තමාටද එකලෙස ක්‍රියාත්මක විය යුතු බව පැවසූ රජු ඔහුගේ ගෙල සිඳින ලෙස ඇමතියන්ට අණ කළ විට ඔවුහු එය ප්‍රතික්ෂේප කළහ. ඔවුන්ගේ පිළිතුරු වූයේ " අපගේ ශාස්තෲන් වහන්සේ

පරහිංසා නොකැමති සේක. චෛත්‍යයේ කැඩුන තැන සාදා කළා කරගත් මැනව යන්නයි.[22] මෙවැනි ක්‍රියාවන් නිසා එළාර පිස්සකු ලෙස සමහරු හඳුන්වති.[23] එහෙත් මෙම කථාවේ යම් සත්‍යයක් ඇත්නම් චෛත්‍යයක් කැඩීම වූ කලී දෙමව්පියන් මැරීම ආදී ආනන්තරීය පාප කර්මයක් මෙන් දරුණුය යන මෙරට පැවැති විශ්වාසය[24] එළාර දැනගෙන සිටින්නට ඇතැයි නිගමනය කළ හැක. බෞද්ධාගමට අනුග්‍රහ දක්වමින් රාජ්‍ය කළ තවත් විදේශීය කණ්ඩායමකි මින්සෙන් බලය උදුරා ගත් පණ්ඩු, පාරින්ද, කුඩා පාරින්ද තිරිතර, දාඨිය, පිඨිය යන අය[25] කුඩා පාරින්ද රජු භාවිතා කරනුයේ 'බුදදසළ පරිදේව' යන නමයි. බුද්ධදාස බුදුන්ට පැවැති භක්තිය පෙන්වන වචනයකි. ද්‍රවිඩයකු වූ මොහු බෞද්ධයකු වූ නිසාම හෝ බෞද්ධයකු බව ඇඟවීමට ඒ නම භාවිතා කළා පමණක් නොව ඔහුගේ මෙහෙසිය විසින්ද විහාරයකට දාන වස්තු පරිත්‍යාග කර ඇති බව සෙල් ප්‍රවරු ලිපියක දැක්වේ.[26] ඔවුන් බෞද්ධයින් නොවූවත් වැසියාගේ ප්‍රසාදය දිනා ගැනීමේ දේශපාලන උපාය වශයෙන් වත් බෞද්ධාගමට ආධාර කළ බව නම් සිතීමට ඉඩ තිබේ.[27]

රජුත් බුදුසමයත් ජනතාවත් ඇඩිව බැඳී ගිය අවධියක් වූයේ දුටුගැමුණු රාජ්‍ය සමයයි. දුටුගැමුණු රජු රට එක්සත් කිරීමේ ව්‍යාපාරය උදෙසා පෙළඹීම හුදෙක් ආගමික හේතුව මත සිදුවූවකි. විදේශික රජකු වූ එළාර දිවයිනේ උතුරු කොටසෙහි බලය පැතිරවීම හේතු කොටගෙන සිංහල බලය මහවැලි ගඟෙන් එතෙර දකුණේ සුළු ප්‍රදේශයකට සීමා විය. විදේශික පිරිස හමුවේ දිවයිනේ සංස්කෘතියට ඇතිවෙමින් තිබූ තර්ජනයෙන් රට බේරා ගැනීම ජාතිමාමක රජකුගේ යුතුකමක් විය. දක්ෂිණ භාරතීය ද්‍රවිඩ පිරිස් විසින් නිරතුරුවම කරන ලද ආක්‍රමණ හේතු කොටගෙන රටේ සමෘද්ධිමත් බව සෑම අතින්ම පිරිහී ගොස් තිබිණ. බෞද්ධ මධ්‍යස්ථානයක්ව පැවැති අනුරපුරය ආක්‍රමණිකයන්ට ගොදුරු වූ අතර ආගම, ශාස්ත්‍රීය ලේඛන සහ භික්ෂු ජීවිතද විනාශ කළේය. මේ නිසා ඇති වූ ජාතික විපතේදී මහ ජනතාවගේ නායකයා ලෙස ජනතාව රැකීම, සංස්කෘතිය රැකීම කළ හැකිව තිබුණේ රජුට පමණි.

ආගම රැකීමේ අභිප්‍රායෙන් යුතුව ඒ සඳහා රජු ඉදිරිපත් වූ ආකාරය මහාවංශයෙහි සඳහන් වන්නේ පහත සඳහන් පරිදිය.

" මාගේ මේ ව්‍යායාමය වූ කලී කිසි කලෙකත් රජ සැපත පිණිස නොවන්නේය. බුද්ධ ශාසනයේ ආරක්ෂාව පිණිසයි"[28] එසේම දුටුගැමුණු රජුගේ සටන් ව්‍යාපාරයේ ස්වරූපය දිග්විජය සඳහා කෙරෙන සටන් ව්‍යාපාරයකට වඩා වෙනස් විය. එය ආරම්භ

කෙරෙනුයේ කුන්තයෙහි ධාතු තිදන් කරවා එයද රැගෙන සේනාව සමඟ තිස්ස මහාරාමයට ගොස් භික්ෂූන් වැදපුදා ගැනීමෙනි. ශාසනය බබලවනු පිණිස කරන ව්‍යාපාරයෙහි ආරක්ෂාව සහ ආශිර්වාදය සලකා සඞ්ඝයා වහන්සේලාද කැටිව ගිය බව [29] මහාවංශයෙහි දැක්වේ. රාජධර්මය අනුව තමා විසින් කළ යුතු වැදගත් කාර්යයක් වූ විදේශිකයන්ගෙන් රට බේරා ගැනීමේ සටනේදී වුවද බුදුදහම පිළිබඳ සිතුවිලි වලින් ඉවත්වීමට රජුට නොහැකි වූ බව මතු සඳහන් ප්‍රකාශයෙන් පැහැදිලි වේ.

එළාර රජු හා සටන් බව ගැමුණු කුමරුට මුහුණ පෑ යුතු දුෂ්කරතා බොහෝ විය. එළාර රජු බුදුසමයට අනුග්‍රහ දැක්වීම නිසා එවක ප්‍රභූන් සහ භික්ෂූන් ඔහු උසස් ලෙස පිළිගෙන තිබුණි. ඒ ඒ අයට සුදුසුකම් වැඩියෙන් පෙන්වීමට තිබුණු බලවත්ම සාධකය බුදු දහමයි.

සිංහලයන් බෞද්ධයන් විය යුතුය. බුද්ධාගම රැකීමේ කාර්යය ඔවුනට අයත්ය. එය අන් කවර ජාතියකටවත් කළ නොහැකියි. එහෙයින් එළාර දමිළ බැවින්ද දකුණු ඉන්දිය බැවින්ද බුදුසමයේ ආරක්ෂාව ඔහුගෙන් ඉටු නොවේයයි ගැමුණු රජු කළ ප්‍රකාශය නිසා මීස සිංහලයන්ගේ අවධානය අන් කවර සැටියකින්වත් දිනා ගැනීමට නොහැකි වන්නට ඉඩ තිබුණි. එහෙයින් දුටුගැමුණුට එම සහාය බුදුසමය නිසාම ලැබුණේය. එළාරට බොහෝ භික්ෂූන් පක්ෂ නිසා දුටුගැමුණුටද සිය පක්ෂපාතීත්වය දක්වන භික්ෂූන් රණබිමට කැඳවා ගෙන ගොස් මහජනයාට කරුණු අවබෝධ කර දීමට සිදු වී යයි නිගමනය කළ හැකියි.

බොහෝ දෙනා පවසන අන්දමට ලක්දිව බෞද්ධාගම බැබලුනේ දුටුගැමුණු රජතුමාගේ කාලයේදීය. රුවන්වැලිසෑය, මිරිසවැටිය, ලෝවාමහාපාය, ආදී අහස උසට නැගුණ වෙහෙර විහාර ඉදිවූයේ මේ යුගයේදීය. භික්ෂූන් වහන්සේලාට මහා සත්කාර ලැබුණේද එම යුගයේදීය. දුටුගැමුණු, සද්ධාතිස්ස ආදී රජුන්ගේ අනුග්‍රහය නිසා උන්වහන්සේලාට උසස් තැන්ක් ලැබුණ මුත් උන් වහන්සේලාගේ සිල්වත් බව නම් අඩු වී ගිය බවට [30] සාධක තිබේ.

බුදුසමයට විශේෂ අනුග්‍රහයක් දැක් වූ තවත් රජෙකි සද්ධාතිස්ස . රුවන්වැලිසෑය, ලෝවාමහාපාය, ආදී කර්මාන්තයන් පිළිබඳ සම්පූර්ණ ගෞරවය මහාවංශකරුවා දුටුගැමුණුට හිමිකර දී ඇතත් ඉන් කොටසක් සද්ධාතිස්සටද ලැබිය යුතුය. රුවන්වැලිසෑය වැඩකටයුතු නිමවන්නට දුටුගැමුණු රජුට නොහැකි විය. සුනු කර්මාන්තය, ඇත් පවුර ආදී කර්මාන්ත

නිම කලේ සද්ධාතිස්ස රජුය.[31] දුටුගැමුණු රජුගේ ලෝහ ප්‍රසාදය ගින්නෙන් දැවී ගිය විට එය සත්මහල් කොට සෑදවූයේ සද්ධාතිස්ස බව මහාවංශය කියයි.[32] මහාවංශයට අනුව අලුත් විහාර රාශියක්ම ඔහු විසින් තනවා ඇත. දක්ෂිනගිරි, කලල්කලෙන, භූමිපාල යන විහාර ඉන් කිහිපයකි.[33]

ලංකාවේ බුද්ධශාසනයේ ආරක්ෂකයා හැටියටද එහි ලෞකික නායකයා හැටියටද රජුන් සැලකුනි. පැරණි සිංහල රජුන් මෙම අදහස කෙතරම් දුරට අනුමත කළේද යන්න රජුන්ගේම ප්‍රකාශ වලින් සනාථ කළ හැකිය. IV වන මිහිදු රජු තමාගේ සෙල්ලිපියක රජුන්ගේ යුතුකම් මෙසේ දක්වා ඇත. "ක්ෂත්‍රියකු රජකු වන්නේ බුදුන්ගේ පාත්‍රය සහ චීවරය රැකීම පිණිසය."[34]

ඉහතින් සඳහන් කළ පරිදි විශාල වෙහෙර විහාරාරාම හා ප්‍රතිමා තැනවීමෙන්ද ඒවා නඩත්තු කිරීමෙන්ද භික්ෂූන් වහන්සේලාට අවශ්‍ය පිණිස සිව්පසය සපයමින්ද සිය අනුග්‍රහය දැක් වූහ.

රජුන් විසින් බෞද්ධාගම කෙරෙහි දැක්වූ අධික අනුග්‍රහය නිසා එක් අතකින් රාජ්‍යයට වාසි සිදුවන අතර තවත් අතකින් අවාසි සිදුවී යයිද කිව හැකිය. රජුන්ගේ අවධානය බොහෝ දුරට ආගමික කටයුතු සඳහාම යොමු වුන නිසා වෙනත් සංවිධාන කටයුතු අඩපන විය. බෞද්ධ ඉගැන්වීම් අනුව රජුන් දසරාජ ධර්මයෙන් රාජ්‍යය කළ යුතුය. ඒ නිසා මිනිසුන් සිය දහස් ගණන් විනාශයට පත්විය හැකි යුද්ධ කටයුතු අනුමත නොකරේ. එසේම දහමට බරවූ රජුන් මෙන්ම මහජනයාද බොහෝ දුරට සටන් කාමයෙන් තොර සාමකාමී අය වූහ. මේ නිසා සිංහල රජවරු යුද්ධ කටයුතු ගැන වැඩි දක්ෂතාවක් නොදැක් වූහ. ඔවුන් යුද්ධ හමුදා වෙනුවට භික්ෂු සංවිධාන ඇති කළ අතර යුද්ධ බලකොටු වෙනුවට චෛත්‍ය හා ආරාම නිර්මාණය කළහ. මේ හේතු කොට ගෙන රටේ ආරක්ෂක කටයුතු දුර්වල විය. රට ආරක්ෂා සංවිධානයෙන් තොරවීම විදේශ ආක්‍රමණිකයන්ට දොර අගුළු හැර තැබීමක් බඳු විය.

විදේශීය ආක්‍රමණ හේතු කොට ගෙන අනුරාධපුර රාජධානිය පරිහානියට ලක් වෙද්දී එයට විකල්ප රාජධානිය බිහිවූයේ පොළොන්නරුවේය. මේ කාලයේදී සිදු වූ චෝල ආක්‍රමණයෙන් ලංකාව බේරා ගැනීම සඳහා උදාර සේවයක් කළ නරපතියන් දෙදෙනෙකු වෙති.